කතුවැකිය

කෘත්‍රිම බුද්ධිය

කෘත්‍රිම බුද්ධිය යනු නූතන ලෝකය හිමිකරගත් ඉතාමත් ප්‍රබල වූ සංවර්ධන ක්‍රියාදාමයකි. එය සුහුරු දුරකථන, මාර්ගගත ඉගෙනුම ආදියේ සිට සෞඛ්‍ය සත්කාරය, කෘෂිකර්මය, ප්‍රවාහනය සහ ව්‍යාපාර ඇතුළු ක්ෂේත්‍ර ගණනාවකට උදාකරදී ඇති ප්‍රගතිය දැවැන්තය. කෙටියෙන්ම කිවහොත් ජනතාව ජීවත්වන, වැඩ කරන ආකාරය දැඩි ලෙස වෙනස්කිරීමේ ප්‍රභවයක් එය සතුය. මෙය සමාජයේ සංවර්ධනය සහ ප්‍රගතිය උදෙසා වන මහඟු මෙවලමක් බවට පත්ව ඇති බව කිවයුතුය.

කෘත්‍රිම බුද්ධියට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඉටුකළ හැකි කාර්යභාරය සුවිශාලය. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තොරතුරු වෙත ඉතා ඉක්මනින් ළඟා වීමට අවස්ථාව සැලසීම මෙන්ම එක් එක් අයට සුවිශේෂිත අධ්‍යාපනික දැනුම හිමිකර දීමටත්, ඵලදායී අධ්‍යාපන සම්පත් සමීප කිරීමටත් එය සමත්ය. සෞඛ්‍ය සත්කාර හැකියා පිළිබඳව විමසුවහොත් වෛද්‍යවරුන්ට රෝග නිර්ණය පහසු කිරීමට, වෛද්‍යමය ප්‍රතිබිම්බයන් හා පරීක්ෂණ නිවැරදිව විශ්ලේෂණය කිරීමට මෙන්ම රෝගී සත්කාර සේවා වඩා ක්‍රමවත් කිරීමට අවස්ථාව උදා කර ඇත. කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් තාක්ෂණය තුළින් වගාබිම් විමර්ශනයට, කාලගුණ තත්ත්වයන් පිළිබඳ අනාවැකි ලබාගැනීමට මෙන්ම ඵලදායීතාව ඉහළ නංවා ගැනීමටත් අවශ්‍ය පසුබිම දිනාගැනීමට ගොවි මහතුන් ඇතුළු කෘෂිකර්ම ක්ෂේත්‍රයට හැකියාව ලැබී ඇත. සරලව ගතහොත් මෙම තාක්ෂණික යෙදවුම් තුළින් ලෝකය ඉදිරියේ පවත්නා සැබෑ ගැටළු නිරාකරණය කරගැනීමටත් සමස්තයක් ලෙස ජනතාවගේ ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නංවාලීමටත් කෘත්‍රිම බුද්ධිය මහෝපකාරී වෙමින් පවතියි.

එසේ වුවද, කෘත්‍රිම බුද්ධිය එල්ල කරන අභියෝග නැතුවාම නොවේ. සමහර රැකියා අතුරුදහන් කිරීමට සහ තවත් සමහරක් වෙනස්කම්වලට ලක් කිරීමට කෘත්‍රිම බුද්ධිය හේතුවිය හැකිය. ඒ ඒ කාර්යයන් ඉටු කිරීමට මිනිසා යොදා ගැනීම වෙනුවට යන්ත්‍ර සූත්‍ර සංවර්ධනය කිරීම එයට හේතුවෙයි. එසේම පෞද්ගලිකත්වය සුරැකීම අපහසු වීම, වැරදි තොරතුරු ලිවීම සහ හානිකර ආකාරයෙන් කෘත්‍රිම බුද්ධිය භාවිතය ආදී ගැටළුද මතුවිය හැකිය. එනිසා කෘත්‍රිම බුද්ධිය හිමිකර දී ඇති තාක්ෂණික ප්‍රගතිය භාවිත කළ යුත්තේ වගකීම, සාරධර්ම, අගයන් පිළිපදිමින් සහ අධ්‍යාපනිකමය දැනුම නිසිලෙස උපයෝගී කරගනිමින් පමණය.

කෙසේවෙතත් තරුණ ප්‍රජාව කෘත්‍රිම බුද්ධිය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් ලැබීම බෙහෙවින්ම වැදගත්ය. එහෙයින් ශිෂ්‍යයන් උගත යුත්තේ කෘත්‍රිම බුද්ධි මෙවලම් පිළිබඳව පමණක් නොව විවේචනාත්මක ලෙස සිතීම, තොරතුරු නිරතුරුව නිසි පරීක්ෂාවකට ලක්කිරීම සහ තාක්ෂණය වගකීමෙන් යුතුව හැසිරවීම පිළිබඳව ද ඔවුන් හැදෑරිය යුතුය. කෘත්‍රිම බුද්ධිය දෙස බැලිය යුත්තේ මානව බුද්ධියට හා නිර්මාණශීලිත්වයට සහායවන මෙවලමක් ලෙස මිස මානව අගයයන්ට ආදේශ කිරීමට යොදාගත හැක්කක් ලෙස නොවන බව අවධාරණය කළ යුතුය.

අවසාන වශයෙන් සඳහන් කළ යුතුවන්නේ දේශීය සහ ගෝලීය සංවර්ධනය සඳහා වන අපේක්ෂා සාක්ෂාත් කරගැනීමට සහාය වීමේ මහත් හැකියාවක් කෘත්‍රිම බුද්ධියට ඇතිබැවින්, නැණවත් ලෙස සාධාරණව සහ වගකීමෙන් යුතුව භාවිත කළහොත් එමගින් වඩා ඵලදායී, නව්‍ය හා තිරසාර අනාගතයක් නිර්මාණය කිරීමට කෘත්‍රිම බුද්ධිය දායක කර ගත හැකිය. කෘත්‍රිම බුද්ධිය දැන් මිනිසා අත පත්ව ඇත, එහෙයින් මෙම මහඟු දායාදය සැමගේ යහපත සහ යහපැවැත්ම වෙනුවෙන් යොදාගැනීමේ වගකීමද ඇත්තේ ඒ මිනිස් දෑත්වලටමය. මෙම විදුරාව කලාපය AI තාක්ෂණය මිනිසාගේ අනාගත ප්‍රයෝජනය සඳහා භාවිතා වන බවත් එම තාක්ෂණය මගින් අනාගත ජයගත හැකි බවත් කතා කරන මහඟු පණිවිඩය ඔබ අතට ගෙන එයි.

තුසිත මලලසේකර